**14-10-2021** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, යෝගා බලයෙන් රාවණ්, පාපයන් ජයගෙන නියම දෂේරාව සමරන්න.

**ප්‍රශ්නය:** රාමායනය හා මහාභාරතය අතර ඇති සම්බන්ධතාවය කුමක්ද? දෂේරාවෙන් ඔප්පු වන්නේ කුමක්ද?

**පිළිතුර:** දෂේරා යනු රාවණ්ගේ අවසානය සහ සීතාගේ නිදහසයි. කොහොමනමුත්, දෂේරා සැමරීමෙන්ම ඔබ රාවණ්ගෙන් නිදහස් නැහැ. මහාභාරතය සිදුවන විට සෑම සීතාවක්ම නිදහස්. මහාභාරත යුද්ධය මඟින් රාවණ්ගේ රාජ්‍යය අවසන් වන අතර, රාමායනය, මහාභාරත හා ගීතාව අතර ගැඹුරු සම්බන්ධතාවක් තිබෙනවා.

**ගීතය:** පළඟැටියන්ගේ සතුටු සමූහය තුළ ආලෝකය දැල් වී ඇත.

ඕම් ශාන්ති. බ්‍රහමින් සමාජය වන්නේ ඔබ බව පියා ඔබට කියනවා. දැන් ඔබ දේව සමාජයේ අය ලෙස හැඳින්විය නොහැකියි. දැන් ඔබ බ්‍රහමින් සමාජයට අයත් වන අතර පසුව දේව සමාජයට අයත් වනවා. අද දෂේරා දිනයේදී, ඔවුන්ගේ රාමායනය අවසන් වීමටයි යන්නේ. කොහොමනමුත්, ඇත්තෙන්ම එය නවතින්නේ නැහැ. රාවණ් මිය යනවානම් රාමායන කතාව අවසන් විය යුතුයි. නමුත් ඇත්තෙන්ම එය අවසන් වන්නේ නැහැ. විමුක්තිය ලැබෙන්නේ මහාභාරතය මගිනි. මේ කරුණුත් වටහා ගත යුතුයි. රාමායනය කියන්නේ කුමක්ද, මහාභාරතය කියන්නේ කුමක්ද? ලෝකයා මේ කිසිවක් ගැන දන්නේ නැහැ. රාමායනය හා මහාභාරතය එකිනෙක හා සම්බන්ධයි. මහාභාරත යුද්ධය මාර්ගයෙන් රාවණ්ගේ රාජ්‍යය අවසන් වනවා. පසුව දෂේරා ආදිය සැමරීම අවශ්‍ය වන්නේ නැහැ. ගීතාව හා මහාභාරතයත් රාවණ්ගේ රාජ්‍යය විනාශ කරනවා. දැන්, කාලය තිබෙන අතර සියලු සූදානම් කිරීම් සිදු කෙරෙනවා ඔවුන්ගේ සටන් බිහිසුණු ඒවා වන අතර ඔබගේ සටන බිහිසුණු එකක් නොවේ. ඔබගේ දෙය ගීතාවයි. ඔබ ගීතාවේ ඥානයට සවන් දෙනවා. එමඟින් සිදුවන්නේ කුමක්ද? රාවණ්ගේ රාජ්‍යය අවසන් වනවා. ඔවුන් රාවණ්ව මරණයට පත් කළත්, එමඟින් රාමාගේ රාජ්‍යය ස්ථාපිත වන්නේ නැහැ. රාමායනයත් මහාභාරතයත් තිබෙනවා. මහාභාරතය තිබෙන්නේ රාවණ්ව විනාශ කිරීමටයි. ඔබට තේරුම් ගැනීම සඳහා බොහෝ ගැඹුරු වූ කරුණු තිබෙනවා. මේ සඳහා පැතිරුණු අසීමිත බුද්ධියක් අවශ්‍ය වෙනවා. මහාභාරත යුද්ධය මඟින් රාවණ් රාජ්‍යය විනාශ වන බව පියා විස්තර කරනවා. රාවණ්ව මරණයට පත් කිරීමෙන් පමණක් රාවණ්ගේ රාජ්‍යය විනාශ වන්නේ නැහැ. ඒ සඳහා සංගම් යුගය අවශ්‍ය වනවා. මේ සංගම් යුගයයි. ඔබ දැන් රාවණ් පරාජය කර ජය ලැබීමට සියලු දේ සූදානම් කරනවා. මේ සඳහා අවශ්‍ය වන්නේ ඥානය නම් ආයුධ මිස භෞතික ආයුධ නොවේ. ඔවුන් රාමා හා රාවණ් අතර සටනක් පෙන්නුම් කර තිබෙනවා. මේ සෑම ආගමික ග්‍රන්ථයක්ම අයත් වන්නේ භක්ති මාර්ගයටයි. ඔබ දැන් යෝගා බලයෙන් රාවණ් රාජ්‍යය පරාජය කරනවා. මෙය සූක්ෂම වූ දෙයක්. ඔබ රාවණ්, පාප පහ පරාජය කර ජය ලබනවා. කොහොමද? ගීතාව මාර්ගයෙන්. බාබා ඔබට ගීතාව කියා දෙනවා. එය, භගවත් එක නොවේ. භගවත් හී පෙන්නුම් කර තිබෙන්නේ ක්‍රිෂ්ණාගේ දිව්‍යමය ක්‍රියායි. ක්‍රිෂ්ණාගේ දිව්‍යමය ක්‍රියා කියා දෙයක් නැහැ. ඔබ දන්නවා මහාභාරත යුද්ධය හා විනාශය සිදු වූ කල, එමඟින් රාවණ්ගේ රාජ්‍යය විනාශයට පත්වන බව. ඉනිමගේ පින්තූරයෙහිත් මෙය පෙන්නුම් කර තිබෙනවා. භක්ති මාර්ගය ඇරඹුණේ රාවණ්ගේ රාජ්‍යය ඇරඹුණු විටයි. මෙය දන්නේ ඔබ පමණයි. ගීතාව මහාභාරත යුද්ධය හා සම්බන්ධයි. ඔබ ගීතාවට සවන් දී රාජ්‍යය ලබා ගන්නවා. පසුව පිරිසිදු කිරීම උදෙසා යුද්ධය සිදු වනවා. භගවත්හී පෙන්නුම් කර ඇති දිව්‍යමය ක්‍රියා, ප්‍රයෝජනයක් නැති දේවල්. ශිව පුරාණයෙහි කිසිවක් නැහැ. ඇත්තෙන්ම ගීතාව තමයි ශිව පුරාණය ලෙස හැඳින්විය යුත්තේ. ශිව බාබා මෙහි අසුන් ගෙන ඥානය දෙනවා. උසස්ම දෙය ගීතාවයි. ගීතාව තමයි සෑම ආගමික ග්‍රන්ථයකටම වඩා කුඩා වන්නේ. මන්ද අනෙක් ආගමික ග්‍රන්ථ සියල්ලක්ම තරමක් විශාලයි. ඒ වගේම ඔවුන් නොයෙකුත් මිනිස්සුන්ගේ ජීවිත කතා ඇතුලත් විශාල පොත් සකසා තිබෙනවා. නේරු මිය ගිය කල, ඔවුන් ඔහුගේ ජීවිත කතාව ඇතුලත් පොත් ගණනාවක් මුද්‍රණය කළා. ගීතාව, හෙවත් ශිව බාබාගේ ජීවිත කතාව අඩංගු පොත බොහෝ විශාල විය යුතුයි. කොහොමනමුත්, ගීතාව ඉතා කුඩායි. මන්ද, පියා කියන්නේ එකම එක දෙයයි මා සිහිපත් කරන්න. එවිට ඔබගේ පාපයන් නැති වී යනු ඇත. ඒ වාගේම චක්‍රයත් තේරුම් ගන්න. එපමණයි. මේ නිසා තමයි ගීතාව ඉතාමත් කුඩාවට හදන්නේ. එම දැනුම, තිබෙන්නේ කට පාඩම් කිරීමටයි. මිනිස්සු ගීතාව ඇති මාල පෙති (පෙන්ඩන) තනනවා, ඔබ දැක තිබෙනවා. එහි අකුරු

ලියා තිබෙන්නේ ඉතාමත් කුඩාවට. බාබාත් දැන් ඔබගේ ගෙල වටා මාල පෙත්තක් දමනවා ඒ ත්‍රිමූර්තිය හා රාජ්‍යය ගැනයි. බාබා කියනවා ගීතාව කියන්නේ වචන දෙකයි ඇල්ෆා සහ බීටා. මෙය තමයි ඒ රහස් මන්ත්‍රය වූ 'මන්මනාභව' නම් වූ මාල පෙත්ත. මා සිහිපත් කරන්න, එවිට ඔබගේ පාප සියල්ල නැති වී යයි. ඔබගේ කාර්යය වන්නේ යෝගා බලය මඟින් ජය ලැබීමයි. පසුව පිරිසිදුකමත් ඔබට අවශ්‍යයි. යෝගා බලයෙන් රාවණ්ගේ රාජ්‍යය විනාශ වීමට තිබෙන බව පියා විස්තර කරනවා. රාවණ්ගේ රාජ්‍යය ආරම්භ වූයේ කවදාද යන්න ගැන කිසිම කෙනෙක් දන්නේ නැහැ. මෙම ඥානය ඉතාමත්ම පහසුයි. එය, එක් ක්ෂණයක් පිළිබඳ වූ දෙයක්. උපත් 84හි ඉනිමගේ පින්තූරයෙහි ඔබ උපත් ගණනාවක් ලබාගෙන තිබෙනවා. එය ඉතාමත් පහසුයි. පියා තමයි ඥාන සාගරය. ඔහු දිගින් දිගටම මෙම ඥානය දෙනවා. මුරලි සඳහා යොදාගත් කොළ සියල්ල ඔබ එක්කළ හොත් විශාල ප්‍රමාණයක් තිබෙනවා. පියා ඔබට විස්තර සහිතව උගන්වනවා. සාරාංශයක් ලෙස ගතහොත් ඔහු කියනවා ඇල්ෆා සිහි කරන්න. වෙන කොහොමද ඔබ ඔබගේ කාලය ගත කරන්නේ? ඔබගේ හිස මත විශාල පාප බරක් තිබෙනවා. එය ඉවත් කරලිය හැක්කේ ස්මරණයෙන්ම පමණයි. මේ සඳහා උත්සාහය අවශ්‍ය වෙනවා. ඔබ නැවත නැවතත් මාව අමතක කරනවා. ඔබ නොකඩවාම බාබාව සිහිපත් කළහොත් ඔබට කිසිම බාධකයක් එන්නේ නැහැ. ඔබ ශරීර අවධානයට පත් වූ විට තමයි බාධක වලට මුහුණ දෙන්න සිදුවන්නේ. ඔබ අවසානයේදී ජීව අවධානයට පත්වනවා. පසුව කල්ප බාගයක්ම පුරා ඔබට කිසිම බාධකයක් එන්නේ නැහැ. මේවා ඔබ විසින් තේරුම් ගත යුතු වන ඉතා ගැඹුරු වූ කරුණුයි. බාබා මුල සිටම ඔබට බොහෝ දේවල් පැවසුවා. ඊට එක් කිරීමක් ලෙස ඔහු කියනවා ඉතා සරළ ලෙස ඇල්ෆා සහ බීටා පමණක් සිහි කරන්න. එපමණයි. ගස ඉතා විශාල ලෙස වර්ධනය වන නමුත් බීජය සියල්ලටම වඩා කුඩා වූවකි. එයින් එවන් වූ විශාල ගසක් නිර්මාණය වනවා. අද, දශේරා දිනයයි. බාබා දැන් ඔබට රාමායනයෙහි හා මහාභාරතය අතර ඇති සබඳතාවය විස්තර කර දෙනවා. රාමායනය අයත් වන්නේ භක්ති මාර්ගයටයි. කල්ප බාගයක් තිස්සේම එය දිගින් දිගටම සිදු වී තිබෙනවා. ඒ කියන්නේ මේ රාවණ් රාජ්‍යය යන්නයි. පසුව මහා භාරතය සිදු වූ විට රාවණ්ගේ රාජ්‍යය අවසානයක් වන අතර රාමාගේ රාජ්‍යය ඇරඹෙනවා. රාමායනය හා මහාභාරතය අතර ඇති වෙනස කුමක්ද? රාමාගේ රාජ්‍යය ස්ථාපනය විය යුතුම වන අතර, රාවණ්ගේ රාජ්‍යය විනාශ විය යුතුමයි. ගීතාවට සවන් දීමෙන් ඔබ ලෝක පාලකයන් බවට පත් වනවා. ගීතාව හා මහාභාරතය තිබෙන්නේ වර්තමාන කාලය සඳහායි, රාවණ්ගේ රාජ්‍යය විනාශ වීම උදෙසායි. ඔවුන් පෙන්නුම් කර තිබෙන යුද්ධය වැරදියි. සටන වන්නේ පාපයන් පහ පරාජය කිරීමේ සටනයි. පියා ඔබට ගීතාවේ වචන දෙකක් පවසනවා 'මන්මනභව හා මධ්‍යාජීභව'. මෙම වචන දෙක ගීතාවේ ආරම්භයේදීත් අවසානයේදීත් එනවා. ගීතාවේ කතාන්තරය දැන් ඒ අයුරින්ම රඟ දැක්වෙන අයුරු දරුවන්ට දැන් තේරෙනවා. කොහොමනමුත්, ඔබ කාට හෝ මේ ගැන කිව්වොත් ඔහු අසාවි නමුත් ක්‍රිෂ්ණා කෝ? බාබා අපට දෙන විස්තරයත්, භක්ති මාර්ගයේ ආගමික ග්‍රන්ථ කියන දේත් අතර විශාල වෙනසක් තිබෙනවා. රාමායනය කුමක්ද, මහාභාරතය කුමක්ද කියා කිසිම කෙනෙක් දන්නේ නැහැ. මහාභාරත යුද්ධයෙන් පසුව පමණයි දිව්‍ය ලෝකයේ දොරටු ඇරෙන්නේ. කොහොමනමුත්, මිනිස්සු මෙය තේරුම් ගන්නේ නැහැ. මේ නිසා තමයි ඉතා සරළ ලෙස ඔබ පියාගේ හැඳින්වීම ලබා දිය යුතු වන්නේ. පියා කියනවා නිරන්තරයෙන්ම මා පමණක් සිහිපත් කරන්න. පියා මුලු ලෝකයාටම මෙය කියනවා. ඒ එකම ගීතාව හොර අදහසින් වෙනස් කර තිබෙනවා. ගීතාව මඟින් සෑම භාෂාවකින්ම අවවාද අනුශාසනා කෙරෙනවා. ඔබගේ රාජ්‍යයේ තිබෙන්නේ එකම එක භාෂාවයි. එහි කිසිම ආගමික ග්‍රන්ථයක් හෝ පොත් හෝ නැහැ. එහි භක්ති මාර්ගයක්ද නැහැ. භාරතයට රාමායනයත්, මහාභාරතයත්, ගීතාවත් සමඟ සම්බන්ධතායක් තිබෙනවා. ඔබ ලෝක පාලකයන් බවට පත් කරවන ගීතාව පරමාත්ම දෙවියන් විසින් තම දරුවන්ට කියනවා. මහාභාරත යුද්ධය අනිවාර්යයෙන්ම සිදු විය යුතුයි. එවිට මෙම අපිරිසිදු ලෝකය විනාශ කර දැමිය හැකියි. ඔබ ගීතාව මඟින් පාරිශුද්ධත්වයට පත්වනවා. පරමාත්ම දෙවියන්, පාරිශුද්ධකරු එන්නේ අවසානයේදී පමණයි. ඔහු කියනවා රාගය ඔබේ ලොකුම සතුරා වන අතර ඔබ එය පරාජය කළ යුතුමයි. කිසිම විටෙක රාගය නම් වූ පාපයෙන් රැවටෙන්න එපා, එමඟින් ඔබට බොහෝ තුවාල ඇති වනවා. ප්‍රසිද්ධ මිනිස්සු හා ඇමතිවරු රාගය නිසා අපකීර්තියට පත්වනවා. පාප නිසා බොහෝ මිනිස්සු නරක් වෙනවා. මේ නිසා තමයි පියා විස්තර කරන්නේ බ්‍රහ්මචර්යා රකින බොහෝ තරුණ අය බාබා ළඟට එනවා. ඔවුන් කිසිම විටෙක විවාහ වන්නේ නැහැ. එසේ ජීවත් වන කාන්තාවන් පවා ඉන්නවා. කන්‍යාවන් කිසිම විටෙක පාපයේ ගැලෙන්නේ නැහැ. කොහොමනමුත්, ඔවුන් එසේ ජීවත් වීමෙන් කිසිම දෙයක් ලබන්නේ නැහැ. මෙහිදී වැදගත්කම තිබෙන්නේ පාරිශුද්ධත්වයට පත්වීම හා උපතක් උපතක් පාසා දිව්‍ය ලෝකයේ පාලකයන් බවට පත්වීම මතයි. උපත් ගණනාවක පාප බර ඔබ හිස මත තිබෙනවා. එම පාප කපා දමතහොත් පමණයි ඔබට දිව්‍ය ලෝකයට යෑමට හැකි වන්නේ. මෙහිදී, මිනිස්සු දිගින් දිගටම පාපයේ

යෙදෙනවා. සමහර විට සන්යාසී කෙනෙක් එක් උපතක් තුළ පාරිශුද්ධ විය හැකියි. නමුත් ඔහු පසුව උපත් ලබා ගත යුතු වන්නේ පාපය මගිනි. රාවණ්ගේ රාජ්‍යයේ කිසිම කෙනෙක්ට පාපයෙන් තොරව උපතක් ලබා ගත නොහැකියි. සමහරු අහනවා එහිදී උපත් සිදුවන්නේ කොහොමද, යෝගා බලය කියන්නේ මොකද්ද? මෙවැනි ප්‍රශ්න ඇසීම අවශ්‍ය වන්නේ නැහැ. එම ලෝකය සම්පූර්ණයෙන් පාපයෙන් තොරයි. එහිදී රාවණ්ගේ රාජ්‍යයක් ස්ථාපනය වන්නේ නැහැ. එමනිසා, එම ප්‍රශ්නය නැඟෙන්නේ නැහැ. සැම දෙයක්ම ගැන ඔබ දර්ශන දකිනවා. එහිදී කෙනෙක් මහළු වූ විට ඔහුට තමා නැවතත් ළදරුවෙක් වන්නේ කෙසේද, තමා තම මවගේ ගර්භාෂය තුළට ඇතුළු වන්නේ කෙසේද ආදී සියලු දේ දර්ශනය වනවා. ඔහු තමා යන ගෙදර ගැන දන්නේ නැහැ. තමා නැවතත් ළදරුවෙක් වීමට යන බව ඔහු දන්නවා. මොණරාගේත් සෙබඩාගේත් උදාහරණය තිබෙනවා. මොණරා කඳුළු සලන විට සෙබඩා පිළිසිඳ ගන්නවා. ගැහැණු හා පිරිමි ගස්ලබු පැළත් එක ළඟ සිටුවනවා. එවිට ඒවායින් ගෙඩි හට ගන්නවා. මෙය පුදුමයක්. අජීවී දේවලුත් මෙසේ සිදුවනවා නම් ස්වර්ණමය යුගයේදී එසේ සිදුවිය නොහැක්කේ කෙසේද? ඔබ තව තවත් දියුණු වෙමින් ඉදිරියට යන විට මේවා ගැන විස්තර සහිතව දැන ගත හැකියි. ප්‍රධානම දෙය වන්නේ පියාව සිහිකිරීමයි. එවිට ඔබට තමෝප්‍රධාන් තත්ත්වයෙන් මිදී සතෝප්‍රධාන් තත්ත්වයට පත්විය හැකියි. ඔබගේ උරුමයත් ලබා ගත හැකියි. ඉන්පසු ඔබට පුළුවන් එහිදී ඇතිවන ක්‍රම සහ විධි පිළිබඳව සළකා බලන්න. යෝගා බලයෙන් ඔබ ලෝක පාලකයන් බවට පත්වනවා. ඉතින් එසේනම් එමඟින් දරුවන් බිහිවිය නොහැක්කේ කෙසේද? බොහෝ මිනිස්සු එවැනි ප්‍රශ්න අහනවා. ඉන්පසු ඔවුන්ට හොඳ ප්‍රතිචාරයක් නොලැබුණු විට ඔවුන් වැටෙනවා! පුංචි පුංචි දේවල් ගැන ඔවුන් සැක ඇති කර ගන්නවා. ආගමික ග්‍රන්ථ වල එවැනි දේවල් නැහැ. ආගමික ග්‍රන්ථ අයත් වන්නේ භක්ති මාර්ගයටයි. ඒ උත්තරීතර පියා, උත්තරීතර ජීවය පැමිණ, බ්‍රහමින්, සූර්ය හා චන්ද්‍ර වාංශික ධර්ම ස්ථාපනය කරනවා. බ්‍රහමින්වරුන් අයිති වන්නේ සංගම් යුගයටයි. බාබා අනිවාර්යයෙන්ම සංගම් යුගයට පැමිණිය යුතුයි. මිනිස්සු කෑගහනවා අහෝ පාරිශුද්ධකරුවාණනි එන්න! විදේශවල මිනිස්සු කියනවා අහෝ විමුක්තිදායකයාණනි, අපගේ දුකින් අපව මුදවා ගන්න! ඔවුන්ව දුකට පත් කරන්නේ කවුද කියා ඔවුන්ම දන්නේ නැහැ. රාවණ්ගේ රාජ්‍යය දැන් අවසානයකට එන බව ඔබ දන්නවා. බාබා ඔබට රාජයෝගා උගන්වනවා. ඔබගේ අධ්‍යාපනය අවසන් වන වීට විනාශය සිදුවන අතර මහාභාරතය ලෙස හඳුන්වන්නේ මෙයයි. මහාභාරතය මඟින් තමයි රාවණ්ගේ රාජ්‍යය විනාශ වන්නේ. දශේරා හිදී ඔවුන් එකම එක රාවණ්ගේ ස්වරූපයේ පඹයෙක් සාදා එය පුළුස්සා දමනවා. එය සීමිත කරුණක් වන අතර මෙය අසීමිත වූ කරුණකි. මුළු ලෝකයම දැන් විනාශ වීමටයි යන්නේ. එවැනි පුංචි දූවරුන් මෙවැනි වූ උසස් දැනුමක් ලබනවා! භෞතික දැනුම හරියට භූමිතෙල් වැනි වන අතර, මෙම ඥානය නියම ගිතෙල් (පිරිසිදු කළ වෙඬරු) වැනියි. මෙහි දිවා රෑ මෙන් වූ වෙනසක් තිබෙනවා. රාවණ්ගේ රාජ්‍යයේදී ඔබට තෙල් තමයි ආහාර සඳහා යොදා ගැනීමට සිදුවන්නේ. මුලදී ගිතෙල් බොහෝ අඩුවට ලැබුණු නමුත්, දැන් එය බොහෝ මිල අධික නිසා ඔබට තෙල් තමයි ආහාර සඳහා යොදාගැනීමට සිදු වන්නේ. මුලදී ගෑස් සහ විදුලිය තිබුණේ නැහැ. පසුගිය වසර කිහිපය තුළ බොහෝ දේ වෙනස් වී තිබෙනවා. මේ සැම දෙයක්ම දැන් විනාශ වී යාමට තිබෙන බව ඔබ දන්නවා. ශිව බාබා අපට උගන්වන්නේ අපව ලක්ෂ්මී හා නාරායන තත්ත්වයට පත් කරවීමටයි. මේ බාබාට බොහෝ සෙයින් මෙම කුල්මත්භාවය තිබෙනවා. මායා දරුවන්ට මෙය අමතක කරවනවා. ඔබ, බාබාගෙන් උරුමය ලබා ගැනීමට පැමිණ සිටිනවා කියා ඔබ කියනවා නම්, ඔබ තුළ එම කුල්මත්භාවය නැත්තේ ඇයි? ඔබ, ඔබගේ මිහිරි වූ නිවහනත්, මිහිරි වූ රාජ්‍යයත් අමතක කරනවා. තම ශරීරය පවා කැප කර සේවයෙහි යෙදෙන දරුවන් කුමාරයින් බවට පත්වන බව බාබා දන්නවා. ඔබට, මෙම කුල්මත්භාවය දැනෙන්නේ නැත්තේ ඇයි? ඔබ ස්මරණයේ යෙදෙන්නේ නැති නිසයි. ඔබ සම්පූර්ණයෙන්ම සේවයෙහි නිරත වන්නේ නැහැ. සමහර වෙලාවට ඔබ තුළ සේවය ගැන විශාල උද්යෝගයක් ඇති වන නමුත්, සමහර වෙලාවට අලස වනවා. මෙසේ සිදුවනවා නම්, ඔබට ඔබගෙන්ම ප්‍රශ්න කර ඊට හේතු විමසිය හැකියි. සමහර විට ඔබ වැරදි කරනවා. මේ නිසා තමයි බාබා ඔබට මෙය විස්තර කළ යුතු වන්නේ. ඔබ ඉතා මිහිරි ලෙස කතා කළ යුතු වන අතර සැම කෙනෙක්වම සතුටට පත් කළ යුතුයි. කිසිම කෙනෙක්ට ආවේගයෙන් ප්‍රතිචාර නොදැක්විය යුතුයි. බාබා සෙනෙහසේ මහා සාගරයයි. මිනිස්සු දැන් ගවයන් මැරීම නැවැත්වීමට බොහෝ උත්සාහ දරණවා. බාබා කියනවා ලොකුම ඝාතනය තමයි රාගය නම් වූ කඩුව පාවිච්චි කිරීම. පළමුවෙන්ම එය නවත්වන්න. අනෙක් ඝාතනය නම් ඔවුන් කෙතරම් උත්සාහ දැරුවත් නවතාලිය හැකි දෙයක් නොවේ, මෙම රාගය නම් වූ කඩුවත් පාවිච්චි නොකළ යුතුයි. මිනිස්සු කියන දේත්, පරම පියා කියන දේත් අතර විශාල වෙනසක් තිබෙනවා. රාගය පරාජය කරන අය පිරිසිඳු ලෝකයේ පාලකයන් බවට පත්වනවා. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. පියා හා සමාන වූ සෙනෙහසේ සාගරයක් බවට පත්වන්න. කිසිම විටෙක ආවේගශීලී වන්න එපා. ඉතා මිහිරි ලෙස කතා කර සැම කෙනෙක්වම සතුටට පත් කරන්න.
2. ඔබගේ මුළු ශරීරයම කැප කර සේවයෙහි යෙදෙන්න. ඔබ, තම පැරණි ශරීරය අත්හැර කුමර කුමරියන් බවට පත්වනවා යන කුල්මත්භාවය තබා ගන්න.

**වරදානය:** ඔබ නිරන්තර සේවාධාරියෙක් වී, සේවය වෙනුවෙන් ඔබ තුළ ඇති සෙනෙහසින්, ඔබගේ ලෞකික පවුල, දේවමය පවුලක් බවට පරිවර්ථනය කරත්වා.

සේවාධාරියෙකුගේ වගකීම වන්නේ, සිතිවිලි, වචන හෝ ක්‍රියා යන කුමන මාර්ගයකින් හෝ නිරන්තරයෙන් සේවයේ නියැලී සිටීමයි. සේවාධාරියෙක් කිසි විටෙක සේවය තමන්ගෙන් වෙන් වූ දෙයක් ලෙස නොසලකයි. තම බුද්ධිය තුළ සේවය කිරීමට නිරන්තර ප්‍රියතාවයක් ඇති අය, තම ලෞකික පවුල දේවමය පවුලක් බවට පරිවර්ථනය කරයි. සේවාධාරියෙක් තම නිවෙස, නිවසක් නොව, සේවා ස්ථානයක් බව සලකයි. සේවාධාරියෙකුගේ ප්‍රධාන ගුණදහම වන්නේ අත්හැරීමය. අත්හැරීමේ ආකල්පයක් ඇති අය, තපස්යාවේ ප්‍රතිරූ විලසින් තම නිවෙස් වල සිටියි, එය මඟින් ඉබේටම සේවය සිදුවෙයි.

**පාඨය:** ඔබගේ සංස්කාර දිව්‍යමය කරගැනීම සඳහා, ඔබගේ මනස සහ බුද්ධිය පරම පියාට කැප කරන්න.

***** ඕම් ශාන්ති *****